චක්‍රලේඛ අංක:- 5/ 2000 (1)

මගේ අංකය:- ලේ/ නිර්
සමුපකාර සේවක කොමිෂන් සභාව,
ශ්‍රාවස්ති මන්දිරය,
කොළඹ 07.
2000.08.31

බස්නාහිර පළාතේ සියලුම සමුපකාර සමිති
සභාපතිවරුන් වෙත,

## බස්නාහිර පළාතේ සමුපකාර සේවකයන් සඳහා අතුරු දීමනාවක් ගෙවීම

ඉහත කාරණය සම්බන්ධව ම විසින් නිකුත් කර ඇති අංක 5/2000 [redacted] දරණ චක්‍රලේඛයේ 2(ඇ) ඡේදය පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතු බවට බස්නාහිර පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභාව තීරණය කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

(ඇ) ඉහත අංක 2 යටතේ වර්ග නොකෙරෙන පාඩු ලබන සමුපකාර සමිති වුවද රජයේ තීරණය ට හිස නමමින් තිසියම් සාධාරණ දීමනාවක් 2000.08.01 දින සිටම සියලුම සේවකයන්ට ගෙවීම සඳහා කටයුතු කළයුතු ය. හැකියාවක් ඇතොත් එම දීමනාව රු. 400/- දීමනාව ම බවට පත් කිරීමට උත්සාහ කළයුතු අතර ඊට අඩු දීමනාවක් ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන්නේ නම් මාස හය අවසන්වන විටවත් රු. 400/- දීමනාව ගෙවීමට හැකිවන සේ සමිතියේ මූල්‍ය තත්වය වර්ධනය කර ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවශ්‍ය සියලුම කටයුතු කළ යුතු ය.

02. එම චක්‍රලේඛයට (ඊ), (උ), (ඌ) වශයෙන් පහත සඳහන් වගන්ති ද ඇතුලත් කිරීමට තීරණය කර ඇති බව දන්වමි.

(ඊ) මෙම අතුරු දීමනාව හිමිවන්නේ රු. 12000/- ට අඩු මාසික වැටුපක් ලබන සේවකයන්ට පමණි.

(උ) දෛනික වැටුප් ලබන සේවකයන්ට දිනකට රු. 16.67 බැගින් දින 24 ක උපරිමයකට යටත්ව මෙම දීමනාව ගෙවිය යුතු ය. (උපරිමය රු. 400/- කි.)

* (ඌ) මෙම අතුරු දීමනාව පාරිතෝෂික මුදල්, සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල් ගණනය සඳහා අදාල නොවිය යුතු ය.

ජේ.එස්. විමලවීර,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත්:- 1. ප්‍රධාන ලේකම් (බ.ප.)
2. ලේකම්, කෘෂිකර්ම, ඉඩම්, නිවාස හා සමුපකාර අමාත්‍යංශය (බ.ප.)
3. සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්(බ.ප.)
4. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්(කොළඹ, කළුතර, ගම්පහ )
5. ලේකම්, සමුපකාර සේවක කොමිෂන් සභාව.
6. සියලුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්
7. සියලුම වෘත්තීය සමිති සංගම්